# උපදෙස් පත්‍රිකාව

**අ.පො.ස. (උසස් පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනාධිපති අරමුදල ඒකාබද්ධව පිරිනැමෙන ශිෂ්‍යත්ව වැඩසටහන - 2024/2025**

## සුදුසුකම්

- අයදුම්කරුගේ පවුලේ මාසික ආදායම රු.100,000/- නොඉක්ම වීම.
- රජයේ පාසලක ඉගෙනුම ලබන ශිෂ්‍යයකු /ශිෂ්‍යාවක වීම.
- 2022 (2023) වර්ෂයේදී පවත්වන ලද අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිට, 2025 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) හැදෑරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් ලැබ අ.පො.ස.(උ.පෙළ) සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයක් ලෙස හදාරන ශිෂ්‍යයකු /ශිෂ්‍යාවක වීම.

## අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම

- අයදුම්පත්‍රයේ අංක 01 සිට 06 දක්වා කොටස් අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතු ය.
- සෑම විටම නිවැරදිම තොරතුරු ඇතුළත් කළ යුතු ය.
- කෙටි පණිවුඩ යැවීමට හැකි දුරකථන අංකයක් සඳහන් කළ යුතුය. ඔබ වෙත එවැනි දුරකථන අංකයක් නොමැති නම් ඔවුන්ගේ එකඟතාව සහිතව පවුලේ ලඟම ඥාතියකුගේ / පාසලේ ගුරුවරයකුගේ/ විදුහල්පතිතුමාගේ දුරකථන අංකයක් ලබා දීමට කටයුතු කළ යුතු ය.
- අදාළ ප්‍රශ්න සඳහා ලකුණු ලබා දීම ද අයදුම්කරු විසින් ම සිදු කළ යුතු අතර අදාළ ප්‍රතිඵල සත්‍ය බවට විදුහල්පති විසින් සහතික කළ යුතු ය.
- පවුලේ ආදායම් තත්ත්වය පිළිබඳව තමන් පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ සහතිකය ද, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ද (ආදායම් වාර්තාවක් ලබා ගැනීම අවශ්‍ය නොවේ) සමඟින් අයදුම්පත් පහත ලිපිනයෙහි පිහිටා ඇති ජනාධිපති අරමුදලට ලියාපදිංචි තැපැලෙන් පමණක් යොමු කළ යුතු ය.

ලේකම්,
ජනාධිපති අරමුදල,
අංක ,35
තුන්වන මහල
ලේක් හවුස් ගොඩනැගිල්ල,
ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10

**01.** ලකුණු ලබා දීමේ ක්‍රමවේදය

| | |
|---|---|
| 01.01. පවුලේ වයස 21ට අඩු දරුවන් සංඛ්‍යාව දෙදෙනෙකු හෝ ඊට වැඩිවීම | - ලකුණු 04 |
| 01.02. දෙමව්පියන් දෙදෙනාම අහිමි වීම | - ලකුණු 06 |
| 01.03. දෙමව්පියන් නොමැතිව භාරකරුවකු ළඟ සිටීම | - ලකුණු 03 |
| 01.04. දෙමව්පියන්ගෙන් එක් අයකු අහිමිවීම | - ලකුණු 02 |
| 01.05. ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ පූර්ණ ශාරීරික දුබලතාවකදී | - ලකුණු 10 |

(අර්ධ දුබලතාවක් නම් ලකුණු 05 ක් පමණක් හිමිවේ)

(උපරිම ලකුණු 25 )

සැ.යු. :- දරුවන් ලෙස සලකනු ලබන්නේ දෙමව්පියන්ගෙන් යැපෙන අවුරුදු 21 ට අඩු අවිවාහක දරුවන්ය. ශාරීරික දුබලතා පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් සහතික කළ යුතුයි.

**02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ අනිවාර්ය විෂය සඳහා**

| | | |
|---|---|---|
| විශිෂ්ට සාමාර්ථයක් සඳහා | (A) | - ලකුණු 08 |
| අධිසම්මාන සාමාර්ථයක් සඳහා | (B) | - ලකුණු 06 |
| සම්මාන සාමාර්ථයක් සඳහා | (C) | - ලකුණු 04 |
| සාමාන්‍ය සාමාර්ථයක් සඳහා | (S) | - ලකුණු 02 |

කාණ්ඩ විෂය සඳහා එක් විෂයයකට ලකුණු 01 බැගින් විෂය 02 ක උපරිමයකට යටත්ව ලකුණු දෙකක් ලබාදිය යුතුය.

(උපරිම ලකුණු 50)

**03. ක්‍රීඩා**

වොලිබෝල්/ දැල්පන්දු/ පාපන්දු/ පැසිපන්දු/ ක්‍රිකට්/ එල්ලේ/ බැඩ්මින්ටන්/ කබඩි / රගර්/ හොකී/ මළල ක්‍රීඩා/ චෙස්/ කැරම්/ ටෙනිස්/ පිහිනුම්/ ජිම්නාස්ටික්/ කරාතේ/ මේස පන්දු / වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**04. සෞන්දර්ය හා විෂය සමගාමී ක්‍රියාකාරකම්**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයො තරග/ ජාතික භාෂා හා සාහිත්‍ය තරඟ/ විවාද/කථික/නිවේදන/දැනුම මිනුම/ චිත්‍ර / නැටුම්/ වාදනය/ ගායනය/වේදිකා නාට්‍ය/විෂය ප්‍රවීනතා ජයග්‍රහණ / ශිෂ්‍යභට /බාලදක්ෂ / ප්‍රථමාධාර/පරිසර නියමු/වෙනත්

| | කලාප මට්ටම | පළාත් මට්ටම | ජාතික මට්ටම |
|---|---|---|---|
| • පළමුවන ස්ථානය | 05 | 07 | 09 |
| • දෙවන ස්ථානය | 04 | 05 | 08 |
| • තුන්වන ස්ථානය | 02 | 03 | 06 |
| • නායකත්වය | 01 | 01 | 01 |

(උපරිම ලකුණු 10)

**05. ශිෂ්‍ය නායකත්වය**

| | |
|---|---|
| පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායක / උපප්‍රධාන ශිෂ්‍ය නායක | - ලකුණු 05 |
| ශිෂ්‍ය නායක (ජ්‍යෙෂ්ඨ/කණිෂ්ඨ ) | - ලකුණු 04 |
| පන්ති නායක | - ලකුණු 02 |

(උපරිම ලකුණු 05)

**සැ.යු. :-**

• ඉහත 03 සහ 04 හිදි, එකම විෂය සමගාමී කටයුත්තක් සඳහා ජාතික, පළාත් හා කලාප යන මට්ටම් සියල්ලටම ලකුණු ලබා නොදිය යුතුය. ලකුණු දීමේ දී සැලකිල්ලට ගතයුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.

• ඉහත 05 හි දීද ලකුණු දීමේ දී සැලකිල්ලට ගත යුත්තේ ඉහළම ලකුණු මට්ටම් පමණි.